# අධ්‍යාපනය විසින් කරන ලද හානිය

සිංහල බෞද්ධයකු වීමට නොහැකිවූ ඕල්කට්තුමා සංස්කෘතියෙන් නොව බුද්ධියෙන් බෞද්ධයෙක් විය. එතුමාගේ බුද්ධාගම සිංහලත්වයෙන් වියෝවිය. මේ බුද්ධාගම ඕල්කට් බුද්ධාගම යැයි කලකට ඉහත දී නම් කෙරිණි. මෙරට ඕල්කට්තුමාගෙන් පසුව ඕල්කට් බෞද්ධයෝ ඇතිවූහ. ඕල්කට් බෞද්ධයා බුද්ධාගම සිංහලකම සමග මිශ්‍ර කිරීමට විරුද්ධ වෙයි. ඕල්කට් බෞද්ධයනට අනුව බුද්ධාගමක්, එසේත් නැත්නම් බුදුදහමක්, මිස සිංහල බුද්ධාගමක් නැත.

එහෙත් මෙයින් කියැවෙන්නේ ඕල්කට් බෞද්ධයෝ යනු ඕල්කට්තුමාගේ ද මැදිහත්වීමෙන් ඇතිකරන ලද බෞද්ධ ඉංගිරිසි පාසල්වලින් බිහිකරන ලද  පුද්ගලයෝ ය යන්න නො වේ. ඒ පාසල්වලින් සිංහල බෞද්ධයන් ද බිහිවුණු අතර වෙනත් පාසල්වලින් ද ඕල්කට් බෞද්ධයෝ බිහිවූහ. ඕල්කට් බෞද්ධයා බුදුදහම සිංහලයන්ගෙන් ඈත්කර වියුක්තව ගනියි. ඒ අතර ඇතැම් විට ඔහු හේතුවාදියෙක් ද වෙයි. ඔහු බුදුදහම බටහිර විද්‍යාව සමග සංසන්දනය කිරීමට වෙහෙසෙන්නේ බුදුදහම විද්‍යාත්මක බව පෙන්වීමට ය. ඕල්කට් බෞද්ධයා කාලාම සූත්‍රයට වැඩි ඇල්මක් දක්වයි. එහෙත් යමකු ඕල්කට් බෞද්ධයකු වන්නේ පසුව කී කරුණු නිසා නොව ඔහු බුදුදහම සිංහලකමින් ඈත්කර වියුක්තව ගන්නා බැවිනි.

බෞද්ධ ඉංගිරීසි පාසල්වල අධ්‍යාපනය ලැබූවන්ගෙන් ඇතැමකු සිංහල බෞද්ධයන් වුව ද ඒ පාසල්වල දෙන ලද අධ්‍යාපනය ඉංගිරීසි ආණ්ඩුවේ අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද නිර්දේශයට අනුකූල විය. ඉංගිරීසි ආණ්ඩුව පාසල්වල බුදුදහම සිංහල විෂය ද ඉගැන්වීමට අවසර දීමෙන් පසුව ඉංගිරීසියෙන් මේ විෂය හැදෑරුවෝ බිහිවූහ. මේ ප්‍රවණතාව වර්ධනයවත්ම ඉංගිරීසියේ ආධිපත්‍යය හේතුකොටගෙන ඉංගිරීසියෙන් ඒ විෂය හැදෑරුවන්ට සිංහලෙන් ඒ විෂය හැදෑරුවන්ට නැති වැදගත්කමක් ලැබිණි.

ඉංගිරිසියෙන් අධ්‍යාපනය ලබාදීම හේතුකොටගෙන ඇතිවූ පිරිස ක්‍රමයෙන් භික්ෂූන් වහන්සේගෙන් ඈත්වූහ. ඒ අධ්‍යාපනයෙහි ඉංගිරිසි සාහිත්‍යය, බටහිර ගණිතය, බටහිර විද්‍යාව, ආණ්ඩු ක්‍රමය (Government) හා පුරවැසි (Civics) ආදී විෂය සාමාන්‍යයෙන් භික්ෂූන් වහන්සේ ඉගෙන නොගත් විෂය විය. ඉතිහාසය පවා යුරෝපීය ඉතිහාසඥයන්ට පෙනුණු ආකාරයට ඉගැන්විණි. ක්‍රමයෙන් ඉංගිරිසි පාසල්වල දෙනු ලැබූ අධ්‍යාපනය ලංකාවේ ඇංග්ලිකන් පල්ලියේ ප්‍රධාන පූජකතැනගේ නායකත්වය යටතට පත්කෙරිණි. සිංහල, බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය වැනි විෂය සම්බන්ධයෙන් භික්ෂූන් වහන්සේ මැදිහත්විණි ද, ඒ විෂයයන්හි පවා ඉංගිරිසියෙන් ඉගෙන ගත් ගිහි පිරිසක් ක්‍රමයෙන් ප්‍රධානිහු වූහ.

ලංඩන් විශ්වවිද්‍යාලයට අනුබද්ධ ව විශ්වවිද්‍යාල ආයතනය (University College) පිහිටුවනු ලැබීමෙන් පසුව තත්වය තවත් බරපතල විය. එහි ඉඳහිට භික්ෂූන් වහන්සේ නමක දකින්නට ලැබුණ ද, අධ්‍යාපනයෙහි නායකත්වය ගිහියන් අතට පත්විය. මේ ගිහියෝ භික්ෂූන් වහන්සේ විසින් පුහුණු කරනු ලැබුවෝ නො වූහ. ඔවුහු බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ කටයුතු කළවුන්ගේ ශිෂ්‍යයෝ වූහ. එහි ප්‍රතිඵලය වූයේ සියළු විෂය බටහිරයන්ට අවශ්‍ය ආකාරයට හසුරුවනු ලැබීම ය. අපේ ඉතිහාසය පවා අපට තවමත් ඉගෙන ගැනීමට සිදු වී ඇත්තේ බටහිර දෘෂ්ටි කෝණයෙනි.

ඉංගිරිසි අධ්‍යාපනයෙහි, එනම් ඉංගිරිසි මාධ්‍යයෙන් දෙනු ලැබූ අධ්‍යාපනයෙහි, එබඳු වෙනස්කම් සිදුවිණි ද සිංහල මාධ්‍යයෙන් දෙනු ලැබූ අධ්‍යාපනය තවදුරටත් භික්ෂූන් වහන්සේගේ අධීක්ෂණය යටතේ පැවතිණි. දහනවවැනි සියවසේ අග භාගයේ පරමධම්ම චෛතිය පිරිවෙන හා පසුව විද්‍යෝදය විද්‍යාලංකාර පිරිවෙන් පිහිටුවනු ලැබීමෙන් පසුව සිංහල මාධ්‍යයෙන් දෙනු ලැබූ අධ්‍යාපනය භික්ෂූන් වහන්සේගේ මඟ පෙන්වීමෙන් කරගෙන යෑම තවදුරටත් තහවුරු විණි.

එහෙත් මේ පිරිවෙන් අධ්‍යාපනය ගැන කරුණු දෙකක් කිව යුතු ය. පළමුවෙන් ම පිරිවෙන්වල අළුත් දැනුමක් නිර්මාණය නො විණි. ථෙරවාද බුදුදහම රැකීම යන්න සිංහල බෞද්ධයන්ගේ ප්‍රධාන කාර්යභාරය වී තිබූ හෙයින් අප කලින් කියා ඇති පරිදි පස්වැනි සියවසෙන් පමණ පසුව මෙරට නව දැනුමක් නිර්මාණය නො විණි. දැනුම නිර්මාණය කිරීම ගැන මෙලෝ හසරක් නොදන්නා අයට මෙසේ කීම ප්‍රශ්නයක් විය හැකි ය. මේ ඇතැමුන් අනෙක් අය විසින්

© Prof. Nalin De Silva

නිර්මාණය කරන ලද දැනුම තමන්ගේ දැනුම මෙන් ප්‍රකාශ කරන්නේ කිසිදු ලජ්ජාවකින් තොරව ය. ඔවුහු බොහෝ විට දේශපාලන බලය ලබාගැනීම සඳහා සිංහල ජාතිය මෙන් ම භික්ෂූන් වහන්සේ ද විකුණති. ඔවුන් විසින් ගසාකනු ලැබුව ද වර්තමානයේ ප්‍රධාන ම අභියෝගය වී ඇත්තේ අපේ දැනුම නිර්මාණය කිරීම ය.

දෙවනුව පිරිවෙන්වල උගන්වනු ලැබුයේ ප්‍රධාන වශයෙන් ම පෙරදිග නිර්මාණය වී තිබූ දැනුම ය. බටහිරයන් විසින් නිර්මාණය කෙරුණු දැනුම එකල වැඩ විසූ පැවිදි පඬිවරු සමස්තයක් ලෙස ගත්කල ඉගෙන නොගත්හ. එබැවින් පිරිවෙන් අධ්‍යාපනය සිංහලෙන් දෙනු ලැබූ පැරණි අධ්‍යාපනයක් ය යන මතය ක්‍රමයෙන් උගතුන් අතර මුල් බැසගත්තේ ය. ඒ දැනුම ගැඹුරු වුවත් අද සමාජයට අවශ්‍ය දැනුමක් පිරිවෙන්වලින් නොලැබෙන්නේ ය යන හැඟීම සාමාන්‍ය ජනතාවට ද ක්‍රමයෙන් කාන්දු විණි.

ඒ කුමක් වුවත් සිංහල මාධ්‍යයෙන් පාසල්වල දෙනු ලැබූ අධ්‍යාපනයට පිරිවෙනෙන් හා භික්ෂූන් වහන්සේගෙන් කෙරුණු බලපෑමක් විය. ඒ පාසල්වල ද විෂය නිර්දේශය සකස් කෙරුණේ ඉංගිරිසින්ගේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් වුව ද එයට බාහිරව භික්ෂූන් වහන්සේගේ බලපෑම එහි අධ්‍යාපනයට තිබිණි. එසේ ගත්කල මෙරට ක්‍රිස්තියානි උගතුන්ගේ ආධිපත්‍යය යටතේ සෘජුව ම බටහිර ක්‍රිස්තියානි අධ්‍යාපනයක් ඉංගිරිසි පාසල්වලින් ලබාදුන් අතර සිංහල පාසල්වල ඉංගිරිසි විෂය නිර්දේශයෙන් බාහිරව සාම්ප්‍රදායික යැයි කියනු ලැබූ අධ්‍යාපනයක් භික්ෂූන් වහන්සේගේ මග පෙන්වීම යටතේ ක්‍රියාත්මක විණි.

ඉංගිරිසි පාසල් කිහිපයක් පමණක් තිබූ බැවින් ද එහි අධ්‍යාපනය ලැබීමට මුදල් ගෙවීමට සිදුවුණු බැවින් ද ඒ නගරවලට සීමා වූ බැවින් ද අධ්‍යාපනය ඔස්සේ වෙනස් කෙරුණේ රටේ ජනගහනයෙන් සුළු කොටසක් පමණකි. ගම්බද පාසල්වලින් ලැබුණු අධ්‍යාපනය ඉංගිරිසින්ගේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ආධිපත්‍යයට හසුවීමෙන් පසුව ද භික්ෂූන් වහන්සේගේ නායකත්වයෙන් ලබාදුණි. එබැවින් නගරවල කෙසේ වුව ද ගම්වල භික්ෂූන් වහන්සේ තවදුරටත් විකල්කදුන් වහන්සේ ලෙස සලකනු ලැබූහ. එබැවින් අවුරුදු සියයකට වැඩි කාලයක් ඉංගිරිසි අධ්‍යාපනයක් ලබාදීමෙන් පසුව ද මෙරටට යම් දේශපාලන නිදහසක් ලැබුණු හතළිහේ දශකයේ ආරම්භයේ ද ගම් වෙනස් කිරීමට ඉංගිරිසින්ට නොහැකි විය. එලෙස ගත්කල ඉංගිරිසින්ගේ අධ්‍යාපන ව්‍යාපෘතියෙහි සීමිත සාර්ථකත්වයක් පමණක් තිබුණි.

එසේ වුවත් වැඩිකල් නොගොස් ම මේ තත්වය වෙනස්විණි. ඉංගිරිසින්ගේ ව්‍යාපෘතිය ඔවුන්ට වඩා හොඳින් ඉංගිරිසියෙන් අධ්‍යාපනයක් ලත් සිංහලයන් අතින් ක්‍රියාත්මක විණි.  හතළිහේ දශකයේ ඉංගිරිසින්ගේ ව්‍යාපෘතිය සාර්ථකවීමට පියවර දෙකක් ගනු ලැබිණි. මේ එක් පියවරක්වත් ගනු ලැබුයේ ඉංගිරිසි අධ්‍යාපන ව්‍යාපෘතිය සාර්ථක කරවීම අරමුණු කරගෙන නො වේ. එහෙත් සිදුවුයේ ඒ ව්‍යාපෘතිය සාර්ථක කිරීමට කරුණු සැලසීම ය. මේ කරුණු විටින් විට කියා ඇතිමුත් මේ සන්දර්භයෙහි ඒ නැවතත් සඳහන් කිරීම අනුචිත නො වේ.

ඒ පියවර දෙකම ගනු ලැබුයේ සී ඩබ්ලිව් ඩබ්ලිව් කන්නන්ගර මහතා විසිනි. කන්නන්ගර මහතා ඒ පියවර ගත්තේ ඉංගිරිසි අධ්‍යාපන ව්‍යාපෘතිය සාර්ථක කිරීම සඳහා නො වේ. එතුමාට අවශ්‍ය වුයේ එතුමා ලැබූ අධ්‍යාපනය රටේ බහුතර ජනතාවගේ දරුවනට ද ලබාදීම ය. එතුමා අධ්‍යාපනය ලැබුයේ ක්‍රිස්තියානි ආගමේ වෙස්ලි පල්ලියේ පාසල්වල ය. එතුමා ඒ අධ්‍යාපනයෙහි ඉතා සාර්ථක ප්‍රතිඵල නෙළා ගත්තේ ය. විභාගවලින් එතුමා සමත් වී ඇත්තේ ඇතැම් අවස්ථාවල ලංකාවේ පමණක් නොව ඉංගිරිසි අධිරාජ්‍යයෙහි ම දක්ෂම ශිෂ්‍යයන් දෙතුන් දෙනා අතරට එක්වෙමිනි. ඒ නිසාම දෝ ඒ අධ්‍යාපනයෙහි තිබූ භයානක පැත්ත, එනම් අධ්‍යාපනය ඔස්සේ ඉංගිරිසි සංස්කෘතිය හා චින්තනය පැතිරවීම හා සිංහල සංස්කෘතිය හැකිනම් නැතිකිරීමත් එසේ නොහැකි නම් දුර්වල කිරීමත් යන්න, එතුමාට නොපෙනෙන්නට ඇත.

නගරවලට පමණක් සීමාවූ ඉංගිරිසි අධ්‍යාපනය ගම්වලට ද ගෙනයෑම සඳහා එතුමා මධ්‍යම මහා විද්‍යාල යනුවෙන් හඳුන්වනු ලැබූ පාසල් පනස් දෙකක් මුල දී පිහිටුවීය. ඒ පාසල් පිහිටුවීමේ දී එහි පළමු විදුහල්පතිවරුන්ට උපදෙස් දී ඇත්තේ තමන් අධ්‍යාපනය ලැබූ පාසල වැනි පාසලක් බිහිකරන ලෙස ය. මේ ඉතා සත්භාවයෙන් දෙන ලද උපදෙසකි. නව විදුහල්පතිවරුන් ද එවැනි ම වූ සත්භාවයකින් ඒ උපදෙස් පිළිගෙන ක්‍රියාත්මක කරන්නට ඇත. මේ පාසල්

© Prof. Nalin De Silva

පිහිටුවීම හේතුකොටගෙන විශාල පිරිසකට තම සමාජ තත්වය වත්මන් ක්‍රමයට සාපේක්ෂව දියුණු කරගැනීමට හැකිවුවා නිසැක ය. එහෙත් එයට වඩා අති විශාල පිරිසකට සූ වී ඇත්තේ කුමක්දැයි සොයා බලනු වටී.

කන්නන්ගර මහතා ගත් දෙවැනි පියවර වුයේ එතෙක් මුදල් අයකර දුන් ඉංගිරිසි අධ්‍යාපනය නොමිළේ දීමට කටයුතු කිරීම ය. නිදහස් අධ්‍යාපනය යනුවෙන් අද කුමක් හඳුන්වනු ලැබුව ද එදා එනමින් කියැවුනේ ඉංගිරිසි පාසල්වලද නොමිළේ අධ්‍යාපනය ලබා දීම ය. එවකටත් සිංහලෙන් අධ්‍යාපනය ලබා දුන්නේ නොමිළයේ ය. ඉංගිරිසියෙන්, එනම් ඉංගිරිසි මාධ්‍යයෙන් ලබාදුන් අධ්‍යාපනයට මුදල් ගෙවීමට සිදුවිය. කන්නන්ගර මහතා ඉංගිරිසි අධ්‍යාපනය ද නොමිළේ ලබාදීමට කටයුතු කෙළේ ය. ඒ සමඟ ක්‍රමයෙන් ඒ අධ්‍යාපනය සිංහලෙන් හා දෙමළෙන් දීමට ද සැලැස්මක් ඇති කෙළේ ය. ඒ අනුව යම් දවසක විශ්වවිද්‍යාලවල ද සිංහල මාධ්‍යයෙන් නොමිළේ බටහිර ක්‍රිස්තියානි අධ්‍යාපනයක් ලබාදිය යුතු විය.

නිදහස් අධ්‍යාපනය අයහපත් දෙයක් යැයි පෙන්වීම මගේ අරමුණ නො වේ. මම ද නිදහස් අධ්‍යාපනය ලැබුවෙක්මි. එමෙන් ම අසූවේ දශකයේ දී මගේ ජීවිතයේ වෙනසක් නොවන්නට ඒ ලැබූ අධ්‍යාපනයෙහි ප්‍රතිඵලයක් ලෙස අද බටහිර ක්‍රිස්තියානි අධ්‍යාපනය වෙනුවෙන් පෙනී සිටින ප්‍රධාන පුද්ගලයකු වීමට තිබුණි. අනපේක්ෂිත ලෙස මට වෙනස්වීමට බලපෑවේ ද බටහිරින් මා ලැබූ මාක්ස්වාදය හා ක්වොන්ටම් භෞතිකය පිළිබඳ දැනුම ය. ඒ කෙසේ වුවත් කන්නන්ගර මහතා ගත් පියවරට විරුද්ධ වූයේ මෙරට එවකටත් ඉංගිරිසි අධ්‍යාපනයක් ලබා සිටි පිටිසෙන් අති විශාල බහුතරයත් මෙරට ක්‍රිස්තියානි හා කතෝලික පල්ලිත් ය. ඉතිහාසයෙහි කටයුතු සිදුවන්නේ ඇතැම්විට පුදුමාකාරව ය. කතෝලික හා ක්‍රිස්තියානි පූජකවරු නිදහස් අධ්‍යාපනයට විරුද්ධවත් දී භික්ෂූන් වහන්සේ, විශේෂයෙන් ම විද්‍යාලංකාර පිරිවෙන හා සම්බන්ධ භික්ෂූන් වහන්සේ එයට පක්ෂව ගමින් ගමට වැඩම කර පෙත්සම් හා වෙනත් ක්‍රියා මාර්ග ඔස්සේ ජනතාව සංවිධානය කළහ. නිදහස් අධ්‍යාපන ක්‍රියාවලිය සීමිත පිරිවෙන් ආධිපත්‍යයත් නැතිකරන බව උන්වහන්සේ නොදැන සිටියහ.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva